# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2402/09 - 2024 සැප්තැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2024.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය ඉදි කිරීමට අමතර ඉඩම් කොටසක් භාවිතා කර ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/MT/546.
2024 සැප්තැම්බර් මස 06 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක, **E 352 F** දියබුබුල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියබුබුල, කොට්ඨාස අංක 6 දුම්රියපොළ පෙදෙස, (මාතලේ මහා නගර සභා සීමාවේ) ගමේ පිහිටි, "නාගොල්ල පාර, වරිපනම් අංකය 25," නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.0018ක් පමණ වන ඉඩම් කොටස :

1A - G 42712 — 08 (2024/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මායිම් :**

| | | |
|---|---|---|
| *උතුරට* | - | මු. පි. මා 1735 හි කැබලි අංක 21, මු. පි. 1127 හි කැබලි අංක F 54 සහ මෙම පිඹුරේ කැබලි අංක 3 |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 3 සහ 2 |
| *දකුණට* | - | කැබලි අංක 2 සහ මු. පි. 1127 හි කැබලි අංක F 54 |
| *බටහිරට* | - | මු. පි. මා 1735 හි කැබලි අංක 22 සහ 21 |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 1. සිරාජ්දීන් රෆිනා උම්මා මිය,
අංක 25,
නාගොල්ල පාර,
මාතලේ.

සහ

බදූර්නිසා රෆික් මිය,
අංක 40,
කොලින්වුඩ් පෙදෙස,
කොළඹ 06.

EOG 09 - 0127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.